www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

## ගුරුවරු හා රජයේ සේවකයින් දුම්රිය කම්කරු වර්ජනයට සම්බන්ධ වීමට සැරසේ

# ප්‍රංශ කම්කරුවන්ට නව දේශපාලන ක්‍රියා මාර්ගයක් අවශ්‍යව ඇත

**Teachers, public employees to join rail workers on strike**
**French workers need a new political strategy**

**ලෝසවෙඅ කතෘ මන්ඩලය විසිනි**
**2007 නොවැම්බර් 19**

නොවැම්බර් 20 ප්‍රංශය පුරා පැන නැගීමට නියමිත වර්ජන හා පෙලපාලි ජනාධිපති නිකොලායි සර්කෝසි ගේ ආන්ඩුව පසුගිය මැයි මස බලයට පත්වූ පසු ඊට එරෙහිව පැන නැගුනු දැවැන්තම සමාජ ව්‍යාපාරය වෙයි. බහු ජනතාවගේ ජීවන මට්ටම්වල හා අයිතිවාසිකම්වල වියදමින් පොහොසතුනට පෙර නොවූ විරූ තරමට ධනය ගොඩ ගසා ගත හැකිවන අයුරින් ප්‍රංශය ලාබ ගරන්නන්ගේ පාරාදීසයක් බවට පත් කිරීමේ සර්කෝසි ගේ දේශපාලන න්‍යාය පත්‍රයට පවතින පුලුල් හා ගැඹුරු විරුද්ධත්වයට මෙය සාක්ෂි දරයි.

ඇමරිකානු ජනාධිපති ජෝර්ජ් ඩබ්. බුෂ් සමග ප්‍රසිද්ධියේ තමාව සමාන කර ගත් සර්කෝසි එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ සාපරාධී විදේශ ප්‍රතිපත්තියට සහය දෙනවා පමනක් නොව දශක ගනනාවක අරගලයන් හරහා කම්කරු පන්තිය දිනාගත් සමාජ අයිතීන් විනාශ කරමින් ප්‍රංශය තුල “ඇමරිකානු කොන්දේසි” ඇති කිරීමටද වලි කයි.

නොවැම්බර් 20 පෙලපාලි, ගුරුවරු, රෝහල්, තැපැල්, නගර සභා හා අනෙකුත් ආන්ඩුවේ කම්කරුවන්, ඊනියා “රෙජීම්ස් ස්පෙසියක්ස්” නමින් හැඳින්වෙන තම විශ්‍රාම ප්‍රතිලාභ ආරක්ෂා කර ගැනීම සඳහා දින හතක් තිස්සේ වර්ජනයේ නිරතව සිටින දුම්රිය, මඟී ප්‍රවාහන හා විදුලි කම්කරුවන් සමගද විශ්ව විද්‍යාල පුද්ගලික ව්‍යවසායයන්ට විවෘත කර දීමේ, උසස් අධ්‍යාපනයේ ගුනාත්මක බව පහත හෙලීමේ හා ඊට ඇති ඉඩකඩ ඇහිරවීමේ ආන්ඩුවේ සැලසුම් වලට එරෙහිව විරෝධතාවයේ යෙදී සිටින ශිෂ්‍යයින් සමගද ඒකාබද්ධ කරවයි.

පරදුවට තැබී ඇත්තේ කම්කරු පන්තියේ සියලුම සමාජ හා ප්‍රජාතාන්ත්‍රික අයිතීන්ය.

ආන්ඩුව සම්බන්ධයෙන් ගත් විට කම්කරු පන්තියේ වඩාත්ම ප්‍රචන්ඩ කොටසක් වන දුම්රිය කම්කරුවන්ගේ පරාජයක් අනෙක් සියලුම කම්කරු කොටස් වලට පහර එල්ල කොට වරෙක එමිලි සෝලා විසින් විස්තර කරනු ලැබූ දරිද්‍රතාවයේ හා කෲර සූරා කෑමේ කොන්දේසි කරා කම්කරු පන්තිය ඇද හෙලීමේ ඉඩ කඩ විවෘත කරයි.

සර්කෝසි තන්ත්‍රයේ අන්තරායයන් අඩු තක්සේරු කිරීම මරනීය වැරැද්දකි.

එහි සමාජ පදනම කුඩාය. ඊට අයත් වන්නේ ජනාධිපති සමග සමාජශීලී වෙමින් සමීපතම දේශපාලන සබඳතා පවත්වන පරිපාලකයින්, පොහොසතුන් හා අධිපොහොසතුන් ආදීන්ය. එනමුදු අබාධිතව ලාබ ගොඩ ගසා ගැනීමට බාධා වන සමාජ සුබ සාධක ක්‍රමය මුලිනුපුටා දැමීම ආදී “ප්‍රතිසංස්කරන” වලට ප්‍රංශය බොහෝ දුරස්තව සිටින බවට අවධාරනය කරන යුරෝපීය ආන්ඩුවල හා ජාත්‍යන්තර මූල්‍ය ප්‍රාග්ධනයෙහි පිටු බලය සර්කෝසි හට ලැබේ. තව දුරටත්, සර්කෝසි හට දේශපාලන ක්‍රියා මාර්ගයක් තිබෙන අතර කුමන වියදමකින් හෝ එය ක්‍රියාවේ යෙදවීමට ඔහු අධිෂ්ටාන කර ගෙන සිටියි.

ඔහුගේ ඉලක්කය වන්නේ කම්කරු පන්තියේ වඩාත්ම ප්‍රචන්ඩකාරී කොටස් හුදෙකලා කොට ඔවුන් තියුනු ලෙස පරදවා සෙසු ජනයා මත කෲර ප්‍රහාර එල්ල කිරීමයි.

දුම්රිය කම්කරුවන් සමග වූ මත භේදය සර්කෝසි බලයට පත් වූ තැන් පටන්ම පරෙස්සමෙන් සූදානම් කල එකකි. එක් එක් වෘත්තිය සමිති නායකයන් පොලඹවා ගනිමින් ඔවුන් එකිනෙකාට එරෙහිව කෙටවීමට ඔහු ක්‍රියා කලේය.

“මඟී ජනයාගේ බලවත් කෝපය වර්ජකයින් වෙත යොමු වීම පිලිබඳව එලී ගනන් බලමින් සිටී” යන සිරස් තලය යටතේ *ලා මොන්ඩේ* පුවත් පත ඉරුදින වාර්තා කලේ ආන්ඩුවේ ඉහලම කව තුල මූලෝපායික කරුනු සාකච්ඡා වූ බවයි. පසුගිය සතියේ තමන් “සාකච්ඡා” නමැති කාඩ් පත සෙල්ලම් කල අතර “මේ වන තෙක් අප කල දේ පසුව තදින් සිටීමට උපකාර වනු ඇතැ”යි ඔහු කියා සිටි බව එම පුවත් පත උපුටා දැක්වීය.

දැන්, දෙවන, වඩාත් කලහකාරී අදියර ඇරඹීමට නියමිතය. “ලබන සතියේ අප දේශපාලනයට හා දෘෂ්ඨිවාදයන්ට පිවිසෙන්නෙමු” යැයි ඔහු පැවසීය.

ඉරු දින 8000 ක් පමන ආන්ඩුවේ යූ එම් පී (ජනප්‍රිය ව්‍යාපාරයක් සඳහා වූ සන්ධානය) පක්ෂ හිතවතුන් වර්ජනයට එරෙහිව පැරිසියේ පෙලපාලි දැක් වූ අතර වර්ජනය නොනැවතුනොත් තව දුරටත් පෙලපාලි දක්වන බව නිව්දනය කලේය.

වැඩ වර්ජිත දුම්රිය කම්කරුවන් පෙන් වූ සටන්කාමීත්වය, අධිෂ්ඨානය හා ස්ථිරසාර බව අගය කල යුතු මට්ටමක පවතී. එහෙත් ආන්ඩුවට විසංසන්දනාත්මක ලෙස වත්මන් ගැටුම ජය ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ගය හෝ නායක්වය ඔවුන් සතුව නොපවතී. වත්මන් ආන්ඩුව සටන්කාමිත්වය මගින් පමනක් පසු පසට තල්ලු කල හැකිය යන විශ්වාසය නිවට පමනක් නොව අතිශයින්ම භයානකය.

සර්කෝසි සිය සමස්ත දේශපාලනික අනාගතයම ඔහුගේ මෙම ඊනියා‍ ප්‍රතිසංස්කරන‍ ක්‍රියාවේ යෙදවීම මත පදනම් කර ඇති අතර ධනේශ්වර ආස්ථානයෙන් ගත් විට ඒවා තව දුරටත් පමා කල නොහේ. මෙම ප්‍රතිසංස්කරන වලට එරෙහිව සටන් වදින කම්කරුවන් හා ශිෂ්‍යයන් දේශපාලනික කර්තව්‍යයන්ට මුහුන දී ඇත.

ආන්ඩුවේ ප්‍රතිවිප්ලවවාදී ක්‍රියා මාර්ගයට ඔවුන් තමන්ගේම විප්ලවවාදී ක්‍රියා මාර්ගයෙන් විරුද්ධත්වය දැක්විය යුතුය. විශ්‍රාම, රැකියා හා අධ්‍යාපනය ආරක්ෂා කර ගත හැක්කේ ගෝල්වාදී ආන්ඩුව හෙලා එය නියමාකාර ප්‍රජාතාන්ත්‍රික කම්කරු ආන්ඩුවකින් විස්තාපනය කිරීම එල්ල කර ගනිමින් සමස්ත කම්කරු පන්තියම කාර්මිකව හා දේශපාලනිකව බල මුලු ගැන්වීමෙනි.

‍"අති වාමාංශය‍" ද ඇතුලු ඊනියා‍" වම‍" හා වෘත්තිය සමිති සංවිධානද එවන් ඉදිරි දර්ශනයකට අතිශයින්ම විරුද්ධය. සර්කෝසිගේ ආයුධ ගබඩාවේ ඇති වඩාත්ම වැදගත් සම්පත වන්නේ මෙම සංවිධානවල බියසුලු බව හා විවෘත සහයෝගිත්වයයි. මෙම සංවිධාන සමග දේශපාලනිකව හා සංවිධානාත්මකව කැඩී ආන්ඩුවේ ක්‍රියාමාගී සමග ඒවායේ සහසම්බන්ධතාව සම්මුති විරහිත ලෙස එලිදරව් කිරීම, සර්කෝසිගේ ප්‍රහාරයන්ට එරෙහි සාර්ථක අරගලයක අනිවාර්ය සාධකය වෙයි.

රෙජිම්ස් ස්පෙසියක්ස් හි‍" ප්‍රතිසංස්කරන‍" වල ප්‍රධාන අංගයක් වන පූර්න විශ්‍රාමයක් සඳහා අවශ්‍ය වසර ගනන 37.5 සිට 40 දක්වා ඉහල දැමීමට සමාජවාදී පක්ෂය විවෘතව සහය දෙයි. සෑම හොරිකඩයෙකුගේම සම්භාව්‍ය තර්කය වන මගී ජනතාවගේ නාමයෙන් දුම්රිය වර්ජනය අවසන් කරන ලෙස සර්කෝසිගේ යූඇම්පීය මෙන්ම එය යලි යලිත් ඉල්ලා සිටියි. මෙම පක්ෂය යම් දිනෙක ආන්ඩු බලය ලබා ගතහොත් සර්කෝසි ගෙන් වෙන් නොවන ආකාරයේ සමාජ ක්‍රියා මාර්ගයන් ක්‍රියාවට දමනු ඇත.

කොමියුනිස්ට් පක්ෂය වර්ජනයට නාමිකව සහය පල කරන අතරම වැඩ වැරුමේ ගෙල මිරිකා දැමීම එල්ල කර ගනිමින් ක්‍රියාත්මක වන ආන්ඩුව සමග සිටින වෘත්තීය සමිති වල උපාමාරු වලට පූර්න සහය ලබා දෙයි.

ආන්ඩුව සමග දේශපාලනික ගැටුමකට යාම කෙසේ හෝ වලක්වා ගැනීමේ අවශ්‍යතාවයෙන් පෙලෙන වෘත්තිය සමිති විසින් කුනු ගනුදෙනුවක් ඇති කර ගැනීම සඳහා දත විකා ගෙන ක්‍රියා කරමින් සිටී. විදුලි හා ගෑස් අංශ තුල දැනටමත් කේවල් කිරීම් වලට පිවිස ඇති වෘත්තිය සමිති වර්ජනය සම්පූර්නයෙන්ම පාහේ අවසානයකට ගෙන ඒම හරහා විදුලි හා ගෑස් කම්කරුවන් දුම්රිය කම්කරුවන්ගෙන් වෙන් කර තිබේ.

රාජ්‍ය දුම්රිය සේවය වන (එස් එන් සී එෆ්) තුල එක් සමිතියක් සී එෆ් ඩී ටී (ප්‍රංශ ප්‍රජාතන්ත්‍රික කම්කරු ෆෙඩරේෂනය) වර්ජනය නවත්වන ලෙස ඉල්ලා ඇති අතර සී ජී ටී (සාමාන්‍ය කම්කරු ෆෙඩරේෂනය) හා සුඩ් (සහයෝගීතාව, එකමුතුව, ප්‍රජාතන්ත්‍රවාදය) ඇතුලු අනෙක් සමිති පහ අගහරුවාදා පෙලපාලි වලින් පසු බදාදා දින කලමනාකාරිත්වය හා ආන්ඩුව සමග වට මේස සාකච්ඡාවකට එකග වී තිබේ.

පාවා දීමක් සූදානම් කිරීමේ තීරනාත්මක ක්‍රියා කලාපය ඉටු කරන්නේ දුම්රිය තුල ප්‍රබලතම වෘත්තීය සමිතිය වන සී ජී ටී යවේ. වර්ජනය ආරම්භ කිරීමට පෙරදී පවා සී ජී ටී ප්‍රධාන ලේකම් බර්නාඩ් තිබෝල්ට් ප්‍රධාන සහන ලබා දීමට ඉදිරිපත් විය. මෙය සාමාන්‍යයෙන් අර්ථකතනය කෙරෙන්නේ යටහත් බව පල කිරීමේ ඉගියක් ලෙසය. *ලිබරේෂන්* පුවත් පත එය හැදින් වූයේ‍"‍" යල්ලම ලබා නොදේ නම් කිසිවක් එපා‍" යන ආකල්පය ප්‍රතික්ෂෙප කිරීමක් ලෙසය.‍"

ලූටේ ඔව්රියේ (කම්කරු අරගල) හා එල් සී ආර් (විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය) හි ක්‍රියා කලාපය කුමක්ද?

සංවිධාන දෙකම නිල වශයෙන් දුම්රිය කම්කරුවන්ගේ වර්ජනයට සහය දෙන අතර ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කරමින්‍" ආන්ඩුව පසුබැස්ස වීමට සමස්ත කම්කරු පන්තිය විසින් දැවැන්ත ප්‍රහාරයක්‍" සඳහා කැදවුම් කරයි.‍" වමේ‍" පක්ෂ හා වෘත්තීය සමිති වල පාවා දෙන්නා වූ ක්‍රියා කලාපය සගවන ඔවුහු කම්කරුවන් ඒවායෙන් කැඩීම වැලැක්වීමට තමන්ට කල හැකි සියල්ලම කරති. ඔවුන්ගේ ලියවිලිවල මෙම සංවිධාන පිලිබද විවේචනයක් සොයා ගැනීම කෙනෙකුට කල නොහැකි තරමය. පිරිසිදු වෘත්තිය සමිති සටන්කාමිත්වය පමනක් ආන්ඩුව පසු බැස්සවීමට ප්‍රමානවත්ය යන භයානක මිථ්‍යාව මෙම සංවිධාන දෙකම පතුරුවයි.

වර්ජනය මැදදී ලූටේ ඔව්රියේ නිවේදනය කරනු ලැබුවේ මින් පෙර සිදු නොවූ ලෙසට නගර ගනනාවක ඒකාබද්ධ මැතිවරන ලැයිස්තු ඉදිරිපත් කිරීමට සමාජවාදී පක්ෂය සමග සාකච්ඡා කරන බවයි. ප්‍රස්තාපිරුලට අනුව මීයා ගිලෙන නැවෙන් ඉවත් වන නමුත් ලූටේ ඔව්රියේ සිදු කරන්නේ එහි විරුද්ධ පැත්තයි. එනම්

මෙම අපකීර්තිමත් ධනපති පක්ෂයට යම් වාමාංශික විශ්වාසනීයත්වයක් ලබා දීමයි.

මේ අතර එල් සී ආර් ප්‍රකාශක ඔලිවියර් බෙසන්සෙනොට් වර්ජනයට සහයෝගය පිනිස, විවෘතව ඊට විරුද්ධ, සමාජවාදී පක්ෂය සමග සහයෝගීතාව ඉල්ලා සිටියි..

1997 සිට 2002 දක්වා ලයනල් ජොසපින්ගේ ආන්ඩුව සමන්විතවූ සමාජවාදී පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය හා හරිත පක්ෂය නමැති බහු වාමාංශික සභාගයේ සියලු පක්ෂවලට ඔහු නොවැම්බර් 16 දින ඉල්ලීමක් ඉදිරිපත් කලේය. එම ඉල්ලීම නම් "සියළුම වාමාංශික පක්ෂ තම වගකීම ඉටුකරමින් වර්ජකයින් සමග එක්විය යුතුයි. එම නිසා මා පවසන්නේ සියළු ප්‍රධාන පක්ෂ නායකයින් ඉතා ඉක්මනින් රැස්වී වර්ජකයින්ට හා ඔවුන්ගේ ඉල්ලීම් වලට සහය දැක්වීම සම්බන්ධයෙන් පියවර ගැනීමට තීරණය කළයුතු යි" යන්නයි.

බෙසන්සෙනොට් රවටන්නට හදන්නේ කාවද? සමාජවාදී පක්ෂය මෙම වර්ජනයට සහාය නොදෙන බව ඔහු දනී. ඔහුගේ මෙම ආයාචනය වංචාවකි.

මෙය ජනවාරියේදී පිහිටුවන ලද ඊනියා ධනපති විරෝධී එල්සීආර් පක්ෂයේ ව්‍යාජ ස්වරූපය පෙන්වා දෙයි. මෙය, අවසානයේදී රොමානෝ ප්‍රොඩිගේ දක්ෂිනාංශික ධනපති ආන්ඩුවට එක්වූ ඉතාලියේ කොමියුනිස්ට් රිෆවුන්ඩේෂනය සිදුකලාක් මෙන් වැඩ කරන ජනතාව සමාජ ප්‍රජාතන්ත්‍රවාදයෙන් වෙන්වී යථා ජාත්‍යන්තර සමාජවාදය කරා යොමුවීම වලක්වාලන තවත් යාන්ත්‍රනයක් පමනි.

ප්‍රබල සමාජ ව්‍යාපාර අත්හැර දැමීම හා පාවාදීම සම්බන්ධ දීර්ඝ ඉතිහාසයකට ප්‍රංශය හිමිකම් කියයි. ජෙනරාල් ඩිගෝල්ගේ පාලනයට එරෙහිව, දහස් ගණන් ශිෂ්‍යයන් හා මිලියන ගනන් වැඩ කරන ජනතාව එක්වී 1968 දී කරන ලද මහා වැඩ වර්ජනයට වසර 40 ක් ගතවී ඇත. එවකට ඩිගෝල් බේරා ගනු ලැබුවේ, කොමියුනිස්ට් පක්ෂය හා සීජීටී ය විසිනි. ග්‍රෙනෙල් සම්මුතියේ මුවාවෙන් ඔවුහු බලය ලබාගැනීම ප්‍රතික්ෂේප කල අතර වර්ජනයේ ගෙල මිරිකා දැමූහ.

ඊට පසුව දේශපාලන දක්ෂිනාංශය බලයෙන් නෙරපා දැමීමට තවත් වසර 13 ක් ගතවිය.අවුරුදු 32 කට ඉහතදී, දක්ෂිනාංශික කන්ඩායම් පෙරලා පැමිනි අතර අවසානයේදී විචී තන්ත්‍රයට ඉඩ සලස්වමින් ලියොන් බ්ලම්ගේ ජනතාවාදී පෙරමුනු ආන්ඩුව විසින් විප්ලවවාදී පරිමානයක තිබූ වැඩ වර්ජන ව්‍යාපාරය පාවාදෙනු ලැබින.

කම්කරු ජනතාව මෙම ඓතිහාසික අත්දැකීම්වල පාඩම් ඉගෙනගැනීම අවශ්‍යය. මුලු පාලක ප්‍රභූවේත්, එහි සියලුම මිත්‍ර පක්ෂවලත්, දේශපාලන නියෝජිතයන්ගේත් කුටෝපායන්ට එරෙහිව කම්කරු පන්තික වැඩ වර්ජන, පෙලපාලි, සහ දේශපාලන ක්‍රියාකාරකම් සම්බන්ධීකරනය කිරීමට දේශපාලන නායකත්වයක් ගොඩනැගිය යුතු අතර, වැඩ කරන ජනතාවගේ අවශ්‍යතාවන්ට අනුරූපවන විප්ලවවාදී සමාජවාදී වැඩසටහනක් සැපයිය යුතුය.

මෙය කලහැකිවන්නේ ජාත්‍යන්තර තලයේ පමනකි. වැඩකරන ජනතාව මුහුන දෙන අර්බුදයට ජාතිකවාදී පිලිතුරු නොමැත. යුරෝපීය සංගමය, යුරෝපයේ ආන්ඩු, සහ මහා ජ්‍යාතන්තර සංගත හා බැංකු සාර්කෝසි පිටුපස සිටිති.

ජර්මානු දුම්රිය රියදුරන් ප්‍රංශ දුම්රිය කම්කරුවන් සමග එක කාලසීමාවකම වර්ජනයට ගොස් ඇත්තේ අහම්බයකින් නොවේ. මහජන සේවාවන් හා තම පුද්ගලික ජීවිතයේ සියලු අංගයන් මහා ව්‍යාපාරයන්ගේ වුවමනාවන්ට නතු කිරීමට එරෙහිව ඔවුහු රයින් නදිය දෙපස සටන් වදිමින් සිටිති.

මෙම අරගලයන් සම්බන්ධීකරනය හා එක්සත් කල යුතුව ඇත.

ලෝක සමාජවාදී වෙබ් අඩවිය කියවන ලෙසත්, සත්‍ය ජ්‍යාත්‍යන්තර සමාජවාදී පක්ෂයක් ගොඩනැගීමේ සටනට හතරවන ජ්‍යාතාන්තරයේ ජ්‍යාතාන්තර කමිටුවට බැඳෙන ලෙසත් අපි ප්‍රංශ කම්කරුවන්ගෙන් සහ ශිෂ්‍යයන්ගෙන් ඉල්ලා සිටිමු.

© www.wsws.org